# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2184/11 - 2020 ජූලි මස 14 වැනි අඟහරුවාදා - 2020.07.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා මාස තුනක කාල සීමාවක් තුළදී සභා රැස්වීම්වලට සහභාගී නොවීම හේතුකොට ගෙන කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වගන්තිය යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ තොම්මයා හකුරු නිරෝෂ් සංජීව රණසිංහ අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කිරාහන්දි තිලකරත්න ද සිල්වා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, කන්ද උඩ චන්ද්‍රලාල් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කිරාහන්දි තිලකරත්න ද සිල්වා, කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කේ. යූ. චන්ද්‍රලාල්,**
තේරීම්භාර නිලධාරි,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2020 ජූලි මස 13 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

07 - 754


1A - G 32483 — 27 (2020/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*